## C1-04

### ශ්‍රී ලංකාවෙ' නිවර්තන වැසි වනාන්තර සංරක්‍ෂණය කිරීමෙ' උපාය මාර්ගයක් ලෙස සීමාන්තරික කලාප පිහිටු වීම සහ එහි බලපෑමට සමනල අඩවිය ස්වභාව රක්‍ෂිතයේ බටහිර බෑවුම' ප්‍රදේශය ඇසුරිනිශ

*එච්. අයි. ජී. සී. කුමාර, එම්. එස්. එම්. එල්. කරුණාරත්න*

*භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. මාතර.*

සමනල අඩවිය ස්වභාව රක්ෂිතය ශ්‍රී ලංකාවේ පිහිටි ජෛව විවිධත්වයෙන් පොහොසත් වනාන්තරයකි. එසේ ම එය දීගු කාලයක් තිස්සේ සමාජ සංස්කෘතික සම්බන්ධතාවන් සමග ගොඩනැගුනක් ද වෙයි. ශ්‍රී ලංකාවේ වනාන්තර සංරක්ෂණය සහ කළමනාකරණය කිරීරීමේ ප්‍රවේශයක් ලෙස ප්‍රජා සහභාගිත්වයෙන් සීමාන්තරික කලාප ගොඩනැගීම කෙතරම් දුරට සාර්ථක වන්නේ ද යන්න මෙම අධ්‍යයනයේ දි සලකා බැලේ. සමනල අඩවියේ බටහිර බෑවුමේ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගුරුළුවාන සහ ශ්‍රී පලාබද්දලග්‍රාම නිලධාරී වසම් වල ගම්මාන අටක් අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරා ගත් අතර ප්‍රාථමික දත්ත රැස්කිරීම සඳහා ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, සිද්ධි අධ්‍යයන සහ සිවිරැස් අධ්‍යයන යන ක්‍රම භාවිත කරන ලදි. ද්විතීයික දත්ත මූලාශ්‍ර ලෙස වන සංරක්‍ෂණ දෙපාර්තමෙ'න්තුවල ග්‍රාම නිළධාරී කාර්යාල සහ ප්‍රාදේශිය ලේකම' කාර්යාලය වැනි ආයතන ද වැදගත් වියගමෙම අධ්‍යයනය අනුව ප්‍රජා සහභාගිත්ව වන කළමනාකරණ ප්‍රවේශයක් ලෙස සීමාන්තරික කලාප ඇති කිරීම සාර්ථක වන සංරක්ෂණ උපක්‍රමයක් බව නිගමනය කළ හැකි ය. එසේ ම වන කළමනාකරණයේ දී ප්‍රජාවගේ වනජ අවශ්‍යතා, ආකල්ප සහ ඔවුන් වනාන්තරය සමග පවත්වා ගනු ලබන සහජීවන සබඳතා වියුක්ත කළ නොහැකි බව ද පැහැදලි වනු ඇත.

*ප්‍රමුඛ පදඃ* සීමාන්තරික කලාප, වනජ අවශ්‍යතා, ප්‍රජාව, වන කළමනාකරණය